**වැලිමඩ ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
**----------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**
---------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2014 මාර්තු 31 දින ද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශ 2013 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 සැප්තැම්බර් 16 දින සභාවේ සභාපතිවරයා වෙත යවා ඇත.

1.2 **මතය**
-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට වැලිමඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
---------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**
----------------------

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.1,900,283 ක විශ්‍රාම වැටුප් දායක මුදල රු.2,582,643 ක් ලෙස ණයහිමියන් යටතේ දැක්වීම නිසා බැරකම් රු.682,360 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බිල්පත් ඉදිරිපත් කර හෝ කාර්යය නිමකර නොතිබුණු කර්මාන්ත හා මිලදී ගැනීම් වෙනුවෙන් ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සැලසීම නිසා වර්ෂයේ වියදම හා දෙසැම්බර් 31 දිනට ණයහිමියන් රු. 209,000 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල රු.86,762 ක වැටුප් ප්‍රතිපූර්ණ මුදල ආදායම් හා වියදම් ගිණුමේ කුලී ආදායම් යටතේ ගිණුම්ගත කිරීම නිසා ආදායම් ආධාර රු.86,762 ක් අඩුවෙන්ද, කුලී ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාල රු.401,841 ක වැටුප් ප්‍රතිපූර්ණ මුදල් මූලධන ආධාර යටතේ ගිණුම්ගත කිරීම නිසා ආදායම් හා වියදම් ගිණුමේ ආදායම් ආධාර රු.401,841 ක් අඩුවෙන් ද, මූලධන ආධාර එම ප්‍රමාණයෙන් වැඩියෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාල "කුලී" ආදායම රු.859,365 ක් "සේවා සඳහා ගාස්තු" ආදායම යටතේ ගිණුම්ගත කිරීම නිසා ආදායම් වියදම් ගිණුමේ කුලී ආදායම රු.859,365 ක් අඩුවෙන් ද, සේවා සඳහා ගාස්තු එම ප්‍රමාණයෙන් වැඩියෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

1.3.2 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**
------------------------------------

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 27,603,372 ක් වූ අතර, එදිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.52,288,987 ක් විය.

1.3.3 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.22,484,057 ක් වූ ගණුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.4 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්**

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන මණ්ඩලය විසින් අනුමත නවාතැන් පොළවලින් පෙර වර්ෂයේ ආදායමෙන් සියයට 01 ක් නොඉක්මවන මුදලක් බලපත්‍ර ගාස්තු ලෙස අයකළ යුතු වුවද, නවාතැන් පොළ 05 කින් එසේ බලපත්‍ර ගාස්තු අයකර ගෙන නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) | මු.රෙ.343 | ක්ෂේත්‍රයේ ආදායම් එකතු කරන නිලධාරීන් වෙත නිකුත් කර තිබුණු උප පත්‍රිකා පොත් පාවිච්චි කිරීමෙන් පසු ආපසු භාර නොදීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) | මු.රෙ. 371 | 1999 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා අවස්ථා 21 කදී විවිධ කාර්යයන් සඳහා සභාවේ නිලධාරීන් හා බාහිර පාර්ශවයන් වෙත ගෙවන ලද රු.721,578 ක අත්තිකාරම් පියවා නොතිබුණි. |
| (iii) | මු.රෙ. 571 | අවස්ථා 497 කදී සභාවේ මුදල් තැන්පත් කර වසර 02 ක කාලයක් ඉක්මවා තිබුණු රු.2,638,826 ක් වූ තැන්පත් ආදායමට ගෙන නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රයේ xxiv වන පරිච්ඡේදයේ 4 වගන්තිය | සභාවේ සේවයේ නියුතුව සිට මියගිය හා සේවය හැර ගිය සේවකයින් 06 දෙනෙකුගෙන් අයවිය යුතු රු.40,503 ක සේවක ණය අයකර ගෙන නොතිබුණි. |

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.10,564,207 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.7,855,566 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,708,641 ක වාසිදායක විචලනයක් නිරීක්ෂණය විය.

2.2 **විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

මූල්‍ය ප්‍රතිඵලයේ ශුද්ධ වැඩිවීම පිළිබඳ විග්‍රහාත්මක සමාලෝචනයක් පහත දැක්වේ.

| පුනරාවර්තන ආදායම | 2013 | 2012 | විචලනය | |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| වරිපනම් බදු | 3,525,769 | 3,400,996 | 124,773 | |
| කුලී | 7,902,655 | 8,684,265 | (781,610) | |
| බලපත්‍ර ගාස්තු | 2,332,024 | 1,999,702 | 332,322 | |
| සේවා සඳහා ගාස්තු | 10,941,890 | 6,638,790 | 4,303,100 | |
| වරෙන්තු ගාස්තු හා දඩ | 1,262,755 | 1,543,908 | (281,153) | |
| වෙනත් ආදායම් | 5,934,703 | 2,713,536 | 3,221,167 | |
| ආදායම් ආධාර | 19,653,945 | 20,532,256 | (878,311) | |
| | | | | 6,040,288 |
| **පුනරාවර්තන වියදම** | | | | |
| වැටුප් | 28,175,177 | 28,608,448 | 433,271 | |
| ගමන් වියදම් | 521,029 | 798,057 | 277,028 | |
| සැපයුම් හා උපකරණ | 3,159,128 | 2,737,750 | (421,378) | |
| ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තුව | 1,153,707 | 628,153 | (525,554) | |
| ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යක සේවා | 3,511,166 | 3,474,450 | (36,716) | |
| පොලී ගෙවීම්, ලාභාංශ හා ප්‍රසාද මුදල් | 3,355,703 | 581,205 | (2,774,498) | |
| ආධාර මුදල් | 39,678 | 33,260 | (6,418) | |
| විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික | 1,073,947 | 796,565 | (277,382) | |
| | | | | (3,331,647) |
| වාසිදායක විචලනය | | | | 2,708,641 |

2.3 **ආදායම් පරිපාලනය**

2.3.1 **ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය**

සමාලෝචිත වර්ෂයේ ආරම්භයේ දී පැවති හිඟ ආදායම් අයකර ගැනීමේ ප්‍රගතිය දුර්වල මට්ටමක පැවතුණි.

2.3.2 **බදු කුලී**

(අ) සභාවට අයත් අංක 58 එළමස් කඩයෙහි හා අංක 59 ගවමස් කඩයෙහි වෙළදාම් කිරීමේ අයිතිය 2011 වර්ෂය සඳහා බදුගත් බදුකරුවන් විසින් ගෙවිය යුතු රු.742,092 ක හිඟ කුලී අයකර ගෙන නොතිබුණි.

(ආ) නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර බදුගෙන තිබුණු බදුකරුවන් විසින් කඩකුලී ගෙවීම පැහැර හැරීම මත 2013 දෙසැම්බර් වන විට අයවිය යුතු රු.922,690 ක් අයකර ගෙන නොතිබුණි.

2.3.3 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පහත පරිදි වේ.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 4,473,220 |
| මුද්දර ගාස්තු | 4,700,350 |
| | 9,173,570 |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 මලාපවාහන ව්‍යාපෘතිය

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ වැලිමඩ නගරයේ ඉදිකල නිමි වැඩ වටිනාකම රු.99,205,979 ක් වූ මලාපවාහන ව්‍යාපෘතිය වැඩ නිමකර 2013 ජනවාරි 14 දින ප්‍රාදේශීය සභාවට භාරදී තිබුණද, 2014 මැයි මාසය වන විටත් සම්බන්ධතාවය ලබාදී තිබුණේ පාරිභෝගිකයින් දස දෙනෙකු සඳහා පමණි.

(ආ) එසේම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර සම්බන්ධතා ලබාදීමට යාමේ දී අදාල ස්ථානවල සම්බන්ධතා නල එළා නොමැතිවීම හේතුවෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණු අතර, ඇතැම් පාරිභෝගිකයින්ගෙන් අයකර තිබුණු මුදල් ද ආපසු ගෙවා තිබුණි.

(ඇ) මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් රු.34,142,123 ක ණය මුදලක් ලබාගෙන තිබුණු අතර, අදාල පොළිය පියවා ගැනීමට හෝ ප්‍රමාණවත් ආදායමක් ව්‍යාපෘතියෙන් උපයා ගැනීමට නොහැකි වී තිබුණි.

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාවට අයත් "උඩ දෙමෝදර" ඉඩමෙහි කොටසක අනවසර ගොඩනැගිල්ලක කොටසක් ඉදිකර ඇති අතර සැලසුම් කමිටුවේ අනුමැතියකින් තොරව සභාපතිවරයා විසින් අදාල ගොඩනැගිලි අයදුම්පත්‍රය අනුමත කර තිබුණි.

(ආ) වැලිමඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල සීමාවට අයත්, තිස් අවුරුදු පදනම මත බදුදී තිබුණු ඉඩම් 5 කට අදාල බදු ගිවිසුමේ 1:3 වගන්තිය අනුව අවුරුදු 05 කට වරක් තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු කර බදු මුදල තීරණය කර නොතිබුණු අතර බදු කුලී අයකිරීම සම්බන්ධයෙන් දිගින් දිගටම නොසැලකිලිමත්ව කටයුතු කර තිබුණි. 2011 ජූලි හා 2014 මැයි වන විට බදු ගිවිසුම් කාල සීමාව අවසන් වී තිබුණු දේපල 05 ක් සම්බන්ධයෙන් අදාල ගිවිසුම්වල කොන්දේසි හා ජනාධිපති ලේකම්ගේ 2010 පෙබරවාරි 03 දිනැති අංක: එස්පී/ආර්ඩී/02/10 දරන චක්‍රලේඛයේ විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි.

(ඇ) කැප්පෙටිපොල උප කාර්යාල බල ප්‍රදේශයට අයත් කරගස්වගුර හා කැටමිල්ල ගහ ලඟ ඉඩම් සඳහා සභාව විසින් රජයේ තක්සේරු වාර්තාවක් ලබා නොගෙන වෙළඳපල මිලට වඩා අඩු නාමික බදුකුලියක් අයකිරීම හේතුවෙන් සභාවට ලැබිය යුතු විශාල ආදායමක් අහිමි වී තිබුණි.

3.3 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

(අ) සභා බල ප්‍රදේශය තුල සන්නිවේදන කුළුණු පවත්වාගෙන යාම වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2006 වර්ෂයේ සිට 2012 වර්ෂය අතරතුර කාලයේ දී ප්‍රතිපූර්ණය කරගත යුතුව තිබුණු රු.1,719,355 ක වැටුප් හා රු.156,500 ක මන්ත්‍රී දීමනා ප්‍රතිපූර්ණය කර ගෙන නොතිබුණි.

(ඇ) නව වෙළඳ සංකීර්ණයේ අංක 56 කඩ කාමරයෙහි ධීවර සංස්ථාව විසින් මාළු වෙළඳාම සිදුකල කාලය වෙනුවෙන් 2012 වර්ෂයට අයවිය යුතු රු.25,670 ක මුදල් ධීවර සංස්ථාවෙන් අයකර ගැනීමෙන් තොරව හිඟ විදුලිය බිල්පත් සභා අරමුදලින් ගෙවා තිබුණි.

3.4 **නිෂ්ක්‍රිය / ඌණ උපයෝජිත වත්කම්**

පහත දැක්වෙන වත්කම් නිෂ්කාර්යව පැවතුණි.

(අ) 1993 වර්ෂයේ දී රු.138,650 කට මිලදී ගෙන තිබුණු අංක 204-8982 දරන ත්‍රිරෝද රථය

(ආ) කැප්පෙටිපොල උප කාර්යාල භූමියෙහි රඳවා තිබෙන පහත සඳහන් වත්කම්

i. සන්වෙක් වර්ගයේ අත් ට්‍රැක්ටරය

ii. 270-0431 දරන ට්‍රැක්ටරය

iii. ට්‍රේලරය

iv. රොටෝ මාස්ටර් අත්ට්‍රැක්රය හා නගුල

(ඇ) කැප්පෙටිපොල උප කාර්යාලයේ 20' x 12' ප්‍රමාණයේ ගබඩා ගොඩනැගිල්ල

(ඈ) උඩ දෙමෝදර ඉඩම

3.5 **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

සභා බල ප්‍රදේශයේ ඝන අපද්‍රව්‍ය එක්රැස් කිරීම හා බැහැර කිරීම හා කළමනාකරණය විධිමත් පරිදි සිදු නොකරන බැවින් පරිසරයට හානිකර තත්ත්වයක් උද්ගතවී පැවතුනි.

4. **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

4.1 **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා සකස් කර ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සකස් කර නොතිබුණි.

4.2 **අයවැය පාලනය**

-----------------

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබූ අයවැය ලේඛණයෙහි ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේ දී සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායී පාලන කාරකයක් වශයෙන් උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

| පුනරාවර්තන ආදායම ප්‍රතිශතය | අයවැයගත | තථ්‍ය | විචලනය | විචලන |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| වරිපනම් හා බදු | 3,190,220 | 3,525,769 | 335,549 | 10.5 |
| කුලී | 11,335,040 | 7,902,656 | 3,432,384 | 30.1 |
| බලපත්‍ර ගාස්තු | 2,692,600 | 2,332,023 | 360,577 | 13.4 |
| සේවා සඳහා ගාස්තු | 18,792,510 | 10,941,888 | 7,850,622 | 41.8 |
| වරෙන්තු ගාස්තු හා දඩ | 1,971,000 | 1,262,756 | 708,244 | 35.9 |
| වෙනත් ආදායම් | 3,025,220 | 5,934,700 | 2,909,480 | 96.2 |
| ආදායම් ආධාර | 20,780,690 | 19,653,945 | 1,126,745 | 5.4 |
| **පුනරාවර්තන වියදම්** | | | | |
| වැටුප් හා වේතන | 35,036,830 | 28,175,177 | 6,861,653 | 19.6 |
| ගමන් වියදම් | 943,600 | 521,029 | 422,571 | 44.8 |
| සැපයුම් හා උපකරණ | 4,318,100 | 3,159,128 | 1,158,972 | 26.8 |
| ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තුව | 2,941,500 | 1,153,706 | 1,787,794 | 60.7 |
| ප්‍රවාහන සම්බන්ධතා හා ආවශ්‍යාක සේවා | 3,855,650 | 3,511,165 | 344,485 | 8.9 |
| පොලී ගෙවීම්, ලාභාංශ හා ප්‍රසාද මුදල් | 511,000 | 3,355,702 | 2,844,702 | 556.6 |
| ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර | 114,000 | 39,678 | 74,322 | 65.2 |
| විශ්‍රාම වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 2,168,290 | 1,073,947 | 1,094,343 | 50.5 |

5. **පද්ධති හා පාලන**

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය